# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 437/46 – 1987 ජනවාරි 19 වැනි සඳුදා – 1987.01.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. - බී. 59/41 II.

### ධීවර ආඥාපනත

(212 වන අධිකාරය වූ) ධීවර ආඥාපනතේ 20 (II) වන වගන්තිය සමග කියවිය යුතු ඒ ආඥාපනතේ 33 වන වගන්තිය යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදනු ලැබ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද නියෝග.

පෙස්ටස් පෙරේරා,
ධීවර අමාත්‍ය.

1986 ජූලි මස 01 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මෙම නියෝග "1986, කොළඹ සහ ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කවල වෙරළට යාබද මුහුදේ ධීවර කටයුතු විධිමත් කිරීමේ නියෝග" යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙහි පළමුවන උපලේඛනයේ නිශ්චය කොට දක්වා ඇති ප්‍රදේශයේ ස්ථිර වශයෙන් පදිංචි තැනැත්තකු නොවන යම් තැනැත්තකු, තමා විසින්ම හෝ පළමුවන උපලේඛනයේ නිශ්චය කොට දක්වා ඇති ප්‍රදේශය තුළ පදිංචි යම් තැනැත්තකුගේ සේවය ගාස්තුවක් ගෙවා හෝ අන් ලෙසකින් ලබා ගැනීමෙන් හෝ මෙහි දෙවන උපලේඛනයේ නිශ්චය කොට දක්වා ඇති මුහුදු ප්‍රදේශය ඇතුළත ට්‍රෝලිං කිරීමේ නිරත නොවිය යුතුය.

3. මෙහි පළමුවන උපලේඛනයේ නිශ්චය කොට දක්වා ඇති ප්‍රදේශය තුළ ස්ථිර වශයෙන් පදිංචි යම් තැනැත්තකු විසින් මෙහි දෙවන උපලේඛනයේ නිශ්චය කොට දක්වා ඇති මුහුදු ප්‍රදේශය ඇතුළත ට්‍රෝලිං කිරීම සඳහා පළමුවන උපලේඛනයේ නිශ්චය කොට දක්වා ඇති ප්‍රදේශයෙන් පිටත යම් තැනැත්තකුගේ හෝ බෝට්ටුවක හෝ ට්‍රෝලර් දැලක හෝ සේවය ගාස්තුවක් ගෙවා හෝ අන් ලෙසකින් හෝ ලබා ගැනීම කරනු නොලැබිය යුතුය.

4. මෙම නියෝගවල -
"ට්‍රෝලිං කිරීම" යන්නෙන් අදහස් වන්නේ "ට්‍රෝල් දැලක්" ජලාශ පතුල දිගේ හෝ ජලකඳ මැදින් හෝ යාන්ත්‍රිකව ඇදීමෙන් කරනු ලබන ධීවර මෙහෙයුම් කාර්යයකි.

"ට්‍රෝල් දැල" යන්නෙන් රාමුවකින් හෝ දණ්ඩකින් හෝ ඉපිලි, බරු, ඔටර් ලෑලි හෝ කයිට්ස් ආදී මගින් හෝ කට විවෘත කර තබනු ලබන ස්වභාවික හෝ කෘත්‍රිම හෝ ද්‍රව්‍යයකින් සාදන ලද උදර ස්වරූපයක් ගන්නා දැලක් අදහස් වේ.

### පළමුවන උපලේඛනය

වත්තල මැතිවරණ කොට්ඨාසය, මෝදර ශාන්ත ජේම්ස් දේවස්ථානයට අයත් වසම, මෝදර වීදියේ ශාන්ත ජෝන්ගේ දේවස්ථානයට අයත් වසම, ලුණු පොකුණ ශාන්ත ඇන්ඩෲගේ දේවස්ථානයට අයත් වසම, මොරටුව, ලුනාව හා අඟුලානත් ඇතුළත සම්පූර්ණ ප්‍රදේශය.

### දෙවන උපලේඛනය

පමුණුගම ග්‍රාමයේ උතුරු සීමාවේ සිට ගල්කිස්ස නගරයේ දකුණු සීමාව දක්වා විහිදෙන කොළඹ සහ ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කවල වෙරළට යාබදව පිහිටි මුහුදට අයත් සම්පූර්ණ ප්‍රදේශය.

1A – CM21281 – 2000(1987/01)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

එල්. ඩී. - බී. 59/41 II

ධීවර ආඥාපනත

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 20 දරන පනතින් සංශෝධිත, (212 වන අධිකාරය වූ) ධීවර ආඥාපනතේ 20 (II) වන වගන්තිය සමග කියවිය යුතු, ඒ පනතේ 33 වන වගන්තිය යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද නියෝග.

පෙස්ටස් පෙරේරා,
ධීවර අමාත්‍ය.

1986 ජනවාරි මස 13 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 1986, හැඹිලි (පර්ස්සීන්) දැල් පිළිබඳ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. කිසිම තැනැත්තකු විසින්, මෙහි පළමුවන උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති මුහුදු ප්‍රදේශය තුළ එළි ආධාරයෙන් හෝ එළි ආධාර කොට නොගෙන හෝ හැඹිලි (පර්ස්සීන්) දැල් භාවිතා කිරීම කරනු නොලැබිය යුතුය.

3. තත් කාර්යය සඳහා තමා වෙත ලේකම්වරයා / විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය පිට මිස, කිසිම තැනැත්තකු විසින් මෙහි පළමුවන උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති මුහුදු ප්‍රදේශයෙන් පිටත හැඹිලි දැලක් භාවිතා නොකළ යුතුය.

4. හැඹිලි දැල් ඒකකයේ හිමියා විසින් 3 වන වගන්තියේ සඳහන් අවසර පත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක් ම, හැඹිලි දැල් භාවිතා කිරීමට අදහස් කරනු ලබන ප්‍රදේශය නිශ්චිතව දක්වමින් සහ මෙහි දෙවන උපලේඛනයේ දක්වා ඇති 'අ' ආකෘතිය අනුව සකස් කොට, ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

5. 3 වන නියෝගය යටතේ නිකුත් කරනු ලබන එක් එක් අවසර පත්‍රය සඳහා රු. 20,000ක් වූ ගාස්තුවක් අය කළ යුතුය.

6. (i) 4 වන නියෝගය යටතේ කරනු ලබන ඉල්ලීමක් මත, ලේකම්වරයා විසින් නිකුත් කරනු ලබන අවසර පත්‍රය, මෙහි දෙවන උපලේඛනයෙහි දක්වා ඇති 'ආ' ආකෘතිය අනුව සකස් කළ යුතු අතර, එහි එම අවසර පත්‍රය දරන්නාට හැඹිලි දැල භාවිතා කිරීමට බලය දී ඇති ප්‍රදේශය, නිශ්චිතව සඳහන් විය යුතුය.

(ii) 6 (1) වන නියෝගය යටතේ නිකුත් කරනු ලබන අවසර පත්‍රය, එක් ලිත් අවුරුද්දකට වලංගු විය යුතු අතර, එය ඒ අවුරුද්ද අවසානයේ දී අලුත් කරනු ලැබිය හැකිය.

(iii) අවසර පත්‍රය අලුත් කිරීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම ඒ අවසර පත්‍රය දරන්නා විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ සමග රුපියල් 20,000ක් වූ ගාස්තුවක් ද ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

7. කිසිම තැනැත්තකු විසින් තත් කාර්යය සඳහා තමා වෙත ලේකම්වරයා විසින් නිකුත් කරනු ලබන (මෙහි මින් මතු "අතිරේක අවසර පත්‍රය" යනුවෙන් සඳහන් කරනු ලබන) අවසර පත්‍රයක බලය පිට මිස අවසර පත්‍රයේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති ප්‍රදේශයෙන් පිටත ප්‍රදේශයක් තුළ යම් හැඹිලි දැලක් භාවිතා නොකළ යුතුය.

8. අතිරේක අවසර පත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක් ම, ඉල්ලුම්කරු විසින් හැඹිලි දැල භාවිතා කරනු ලබන අතිරේක ප්‍රදේශය දක්වමින් සහ මෙහි දෙවන උපලේඛනයෙහි දක්වා ඇති 'ඇ' ආකෘතිය අනුව සකස් කොට ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

9. එකම ලිත් අවුරුද්දක් තුළ නිකුත් කරනු ලබන එක් එක් අතිරේක අවසර පත්‍රය සඳහා රුපියල් 5,000ක් වූ ගාස්තුවක් අය කළ යුතුය.

10. අතිරේක අවසර පත්‍රය, මෙහි දෙවන උපලේඛනයෙහි දක්වා ඇති 'ඇ' ආකෘතිය අනුව සකස් කළ යුතු අතර, එහි හැඹිලි දැල භාවිතා කරනු ලබන අතිරේක ප්‍රදේශය නිශ්චිතව සඳහන් විය යුතුය.

11. කිසිම තැනැත්තකු විසින්, දිගින් මීටර් 225 ට වැඩි වන හැඹිලි දැලක් භාවිතා නොකළ යුතුය.

12. කිසිම තැනැත්තකු විසින් මසුන් ඇද ගැනීම පිණිස වොට් 1500 ට වැඩි මුළු වොට් බලයක් ඇති මතු පිට පහන් පාවිච්චි නොකළ යුතුය.

13. කිසිම තැනැත්තකු විසින් අඟල් 3/8ට වඩා කුඩා ප්‍රමාණයේ ඇස් ඇති හැඹිලි දැලක් පාවිච්චි නොකළ යුතුය.

14. කෙළවල්ලන් සහ කෙළවල්ලන් සමාන මසුන් ඇල්ලීම සඳහා පාවිච්චි කරනු ලබන යම් හැඹිලි දැල් සම්බන්ධයෙන් 11 වන සහ 12 වන නියෝග බල නොපැවැත්විය යුතුය.

15. මේ නියෝග යටතේ නිකුත් කරන ලද කිසිම අවසර පත්‍රයක් හෝ අතිරේක අවසර පත්‍රයක් පැවරිය නොහැකි විය යුතු අතර, මේ නියෝගය කඩ කිරීම ධීවර ආඥාපනත යටතේ සහ මෙම නියෝග යටතේ වරදක් ලෙස සලකනු ලැබිය යුතුය.

16. මේ නියෝග යටතේ නිකුත් කරන ලද සෑම අවසර පත්‍රයක් ම සහ අතිරේක අවසර පත්‍රයක් ම මසුන් මැරීමේ කාලය තුළ යාත්‍රාවෙහි ගෙන යා යුතු අතර, බලයලත් නිලධරයකු විසින් පරීක්ෂා කිරීම සඳහා එය ඉල්ලා සිටිනු ලැබුවහොත්, ඒ සඳහා එය ඉදිරිපත් කළ යුතුය.

17. මේ නියෝගය යටතේ නිකුත් කරන ලද සෑම අවසර පත්‍රයක් ම සහ අතිරේක අවසර පත්‍රයක් ම, එහි නිශ්චිතව සඳහන් කොන්දේසිවලට ද මෙම නියෝග යටතේ නිශ්චිතව දැක්වෙන කොන්දේසිවලට ද ධීවර ආඥාපනතේ සඳහන් විධිවිධානවලට ද යටත් විය යුතුය.

18. මේ නියෝග යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයේ හෝ අතිරේක අවසර පත්‍රයේ යම් කොන්දේසියක් හෝ කොන්දේසි සියල්ලම හෝ වෙනස් කිරීමට, සංශෝධනය කිරීමට හෝ පරිච්චින්න කිරීමට අමාත්‍යවරයාට බලය තිබිය යුතුය.

19. යම් ප්‍රදේශයක් තුළ පවත්නා සම්පත් පිළිබඳව හා හැඹිලි දැල් පාවිච්චි කිරීමෙන් වෙනත් වර්ගවල මසුන් ඇල්ලීමේ ඒකකවල මසුන් ඇල්ලීම කෙරෙහි ඇතිවන බලපෑම සැලකිල්ලට ගෙන එම ප්‍රදේශය තුළ භාවිතා කරනු ලැබිය යුතු හැඹිලි දැල් සංඛ්‍යාව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකිය.

20. යම් ප්‍රදේශයක භාවිතා කිරීමට අවසර දෙනු ලබන හැඹිලි දැල් සංඛ්‍යාව, 19 වන වගන්තිය යටතේ තීරණය කර ඇති සංඛ්‍යාව නොඉක්මවිය යුතුය. යම් ප්‍රදේශයක් සඳහා ඇති ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව සැලකිල්ලට ගෙන වට වාර ක්‍රමයක පදනම මත දැල් භාවිතා කරනු ලැබිය හැකි අවස්ථාවල එසේ තීරණය කරනු ලබන සංඛ්‍යාවට වැඩි දැල් සංඛ්‍යාවක් භාවිතා කිරීමට අමාත්‍යවරයා විසින් අවසර දෙනු ලැබිය හැකිය.

21. මෙම නියෝගවල.-

'බලයලත් නිලධරයා' යන්නෙන් ධීවර ආඥාපනත යටතේ පත් කරන ලද ධීවර පරීක්ෂකගේ තරාතිරමට නොඅඩු යම් නිලධරයකු, නාවික හමුදාවේ සුළු නිලධරයකුගේ තරාතිරමට නොඅඩු යම් සාමාජිකයකු, ගුවන් හමුදාවේ සැරයන්වරයකුගේ තරාතිරමට නොඅඩු යම් සාමාජිකයකු, පොලිස් සැරයන්වරයකුගේ තරාතිරමට නොඅඩු යම් පොලිස් නිලධරයකු හා ධීවර අමාත්‍යවරයා විසින් ලියවිල්ලක් මගින් නමින් හෝ තනතුරින් හෝ නම් කරන ලද වෙනත් යම් තැනැත්තකු අදහස් වේ;

'හැඹිලි දැල' යන්නෙන්, මැදි දියේ මසුන් රැනක් පැතිවලින් මෙන්ම පහළින් ද වට කරගැනීම සඳහා විසි කරනු ලබන සහ පසුව හැඹිලි වලල්ලකින් පහළ කොටස වසාලනු ලබන, දිග නොගැඹුරු තීරයක් ලෙස සාදා ඇති දැල් වළල්ලක් අදහස් වේ.

'හැඹිලි දැල් ඒකකය' යන්නෙන් හැඹිලි දැල් මසුන් මැරීමේ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ප්‍රධාන යාත්‍රාවකින්, හැඹිලි දැලකින් හා තවත් කුඩා යාත්‍රාවකින් ද සමන්විත වූ ඒකකය අදහස් වේ.

'ලේකම්වරයා' යන්නෙන් ධීවර විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

'මතුපිට පහන්' යන්නෙන් විදුලි ජනකයක් හෝ සංග්‍රාහකයක් හෝ මගින් බල ගැන්වෙන්නා වූ ද මසුන් ඇද ගැනීම සඳහා ජලය මතුපිටට ආලෝකය යොමු කරනු ලබන්නා වූ ද විදුලි පහන් අදහස් වේ.

(2 වන නියෝගය)

### පළමුවන උපලේඛනය

කොළඹ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, අම්පාර, මඩකලපුව සහ ත්‍රිකුණාමලය යන පරිපාලන දිස්ත්‍රික්කවල වෙරළේ සිට සැතපුම් 07 ක් ඇතුළත පිහිටි මුහුදු කොටස,

සහ

ගම්පහ, පුත්තලම, මන්නාරම, මුලතිව් සහ යාපනය යන පරිපාලන දිස්ත්‍රික්කවල වෙරළේ සිට සැතපුම් 10 ක් ඇතුළත පිහිටි මුහුදු කොටස.

(4 වන නියෝගය)

### දෙවන උපලේඛනය

'අ' ආකෘතිය

#### හැඹිලි (පර්ස්සීන්) දැලක් භාවිතා කිරීම සඳහා අවසර පත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රය

1. (අ) ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම: ———.
   (ආ) ඉල්ලුම්කරුගේ ලිපිනය: ———.
   (ඇ) ජාතික හැඳුනුම්පත් අංකය: ———.

2. රැකියාව: ———.

3. ඉල්ලුම්කරු හැඹිලි දැල භාවිතා කිරීමට අදහස් කරන ප්‍රදේශය: ———.

4. හැඹිලි දැල් ඒකකය පරීක්ෂා කර බැලිය හැකි ස්ථානය: ———.

5. පාවිච්චි කරනු ලබන ප්‍රධාන යාත්‍රාවේ විස්තර:
   (අ) වර්ගය: ———.
   (ආ) විශාලත්වය: ———.
   (ඇ) ලියාපදිංචි අංකය සහ ලියාපදිංචිය අන්තිමට අලුත් කළ දිනය: ———.

6. හැඹිලි දැලේ විස්තරය: ———.
   (අ) දිග: ———.
   (ආ) ගැඹුර: ———.
   (ඇ) දැල් කඳේ ඇසක ප්‍රමාණය: ———.
   (ඈ) දැල් වඩියේ ඇසක ප්‍රමාණය: ———.

7. පාවිච්චි කරනු ලබන පහන්වල විස්තරය: ———.

| | ගණන | එක පහනක වොට් ගණන | මුළු වොට් ගණන |
|---|---|---|---|
| (අ) මතුපිට පහන්: ———. | | | |
| (ආ) දිය යට පහන්: ———. | | | |

8. සේවක සංඛ්‍යාව: ———.

මා විසින් සපයන ලද විස්තර සත්‍ය හා නිවැරදි බවට මම සහතික කරමි.

―――――――――

ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය: ———.

හැඹිලි දැලක් භාවිතා කිරීම සඳහා අවසර පත්‍රයක්
ඉල්ලුම් කිරීම පිළිබඳ ප්‍රා. ධී. ප./ධී. ප. වාර්තාව

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම: ———.

2. ලිපිනය: ———.

3. ඉල්ලුම්කරු හැඹිලි දැල භාවිතා කිරීමට අදහස් කරන ප්‍රදේශය: ———.

4. පාවිච්චි කරනු ලබන යාත්‍රාවේ විස්තර:
   (අ) වර්ගය: ———.
   (ආ) විශාලත්වය: ———.
   (ඇ) ලියාපදිංචි අංකය: ———.
   (ඈ) යාත්‍රාවේ ලියාපදිංචි අංකය ප්‍රවර්තන වර්ෂයට අළුත් කර තිබේද: ———.
   එසේ නම්, අලුත් කිරීමේ සහතිකයේ අංකය හා දිනය: ———.

5. හැඹිලි දැලේ විස්තර: ———.
   (අ) දිග: ———.
   (ආ) ගැඹුර: ———.
   (ඇ) දැල් කඳේ ඇසක ප්‍රමාණය: ———.
   (ඈ) දැල් මඩියේ ඇසක ප්‍රමාණය: ———.

6. පාවිච්චි කරනු ලබන පහන්වල විස්තර: ———.
   (අ) මතුපිට පහන්: ———.
   (ආ) දිය යට පහන්: ———.

7. නිරීක්ෂණ සහ නිර්දේශ: ———.

————————
අත්සන සහ පදවිය.

දිනය: ———.

දි. ධී. ව්‍යා. නි. ගේ නිර්දේශය: ———.

(3 වන සහ 6 වන නියෝග)

අංකය:

'ආ' ආකෘතිය
හැඹිලි දැලක් භාවිතා කිරීම සඳහා අවසර පත්‍රය

1985 හැඹිලි දැල් පිළිබඳ නියෝග යටතේ දෙවන උපලේඛනයෙහි විස්තර කර ඇති ප්‍රදේශ තුළ, මසුන් ඇල්ලීමේ කාර්යය සඳහා පළමුවන උපලේඛනයෙහි විස්තර කර ඇති ප්‍රධාන යාත්‍රාව පාවිච්චි කොට, හැඹිලි දැල භාවිතා කිරීමට .................. පදිංචි .................. ට මෙයින් අවසර දෙනු ලැබේ.

2. මේ අවසර පත්‍රය පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව .................. දෙසැම්බර් මස 31 වන දින තෙක් වලංගු වන්නේය–

(i) මේ අවසර පත්‍රය මෙහි නම් සඳහන් කරනු ලැබ ඇති අවසර පත්‍රය දරන්නාට පමණක් සීමාවන අතර එය අන්සතු කළ නොහැක්කේය.

(ii) මේ අවසර පත්‍රය ඉහත සඳහන් නියෝගවල විධිවිධානවලට යටත් වන්නේ ය.

පළමුවන උපලේඛනය

1. ප්‍රධාන යාත්‍රාවේ විශාලත්වය සහ ලියාපදිංචි අංකය:

දෙවන උපලේඛනය

————————
ධීවර ලේකම්.

දිනය: ———.

(8 වන නියෝගය)

'ඇ' ආකෘතිය
හැඹිලි දැල භාවිතා කරන ප්‍රදේශය වෙනස් කිරීම සඳහා අවසර පත්‍රයක් ඉල්ලුම් කිරීම

1. (අ) ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම: ———.
   (ආ) ඉල්ලුම්කරුගේ ලිපිනය: ———.

2. (අ) හැඹිලි දැලක් භාවිතා කිරීම සඳහා බලපත්‍රයක් ලබාගෙන තිබේද?
   (ආ) එසේ නම්, බලපත්‍රයේ අංකය හා එහි වලංගු කාලය අවසන් වන දිනය: ———.

3. දැනට හැඹිලි දැල භාවිතා කරන ප්‍රදේශය: ———.

4. ඉල්ලුම්කරු හැඹිලි දැල භාවිතා කිරීමට අදහස් කරන අලුත් ප්‍රදේශය: ———.

5. ප්‍රදේශය වෙනස් කිරීමට හේතු: ———.

මා විසින් ඉහත සපයන ලද විස්තර සත්‍ය හා නිවැරදි බවට මම සහතික කරමි.

————————
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය: ———.

අංකය:
(7 වන සහ 10 වන නියෝග)

'ඈ' ආකෘතිය
හැඹිලි දැල භාවිතා කරන ප්‍රදේශය වෙනස් කිරීම සඳහා අවසර පත්‍රය

1985 හැඹිලි දැල් පිළිබඳ නියෝග යටතේ, අංක .................. සහ .................. දින දරන අවසර පත්‍රයෙහි සඳහන් හැඹිලි දැල භාවිතා කරන ප්‍රදේශය මෙහි පළමුවන උපලේඛනයෙහි විස්තර කර ඇති ප්‍රදේශයට වෙනස් කිරීමට .................. පදිංචි .................. ට මෙයින් අවසර දෙනු ලැබේ.

පළමුවන උපලේඛනය

————————
ධීවර ලේකම්.

දිනය: ———.

02 – 51

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.